ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

# 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය

2025 ජනවාරි 11 වන දින පැවැත්වීමට නියමිත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය පහත පරිදි සැසිවාර 4 කින් පැවැත්වේ.

**පළමු සැසිය - පෙ.ව. 7.00 - පෙ.ව. 10.00**
**දෙවන සැසිය - පෙ.ව. 10.15 - ප.ව. 01.15**
**තෙවන සැසිය - ප.ව. 2.00 - ප.ව. 5.00**
**සිව්වන සැසිය - ප.ව. 5.15 - ප.ව. 8.15**

- **උපාධි ලෝගුව, උපාධි සාටකය, හිස්වැසුම හා අදාළ ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම.**

සියලුම උපාධිලාභින්හට 2025 ජනවාරි 04 සහ 2025 ජනවාරි 05 යන දිනයන්හි උපාධි ලෝගුව, උපාධි සාටකය, හිස්වැසුම හා අදාළ ප්‍රවේශපත්‍ර නිකුත් කරන අතර, ඡායාරූප ලබා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් එදින ලබා දීමටත් කටයුතු කරනු ලැබේ.

එක් එක් උපාධිලාභියා තම උපාධි ලෝගුව ලබා ගැනීමට පැමිණිය යුතු දිනය, වේලාව සහ උපාධිලාභීන්ගේ ඡායාරූප ලබා ගැනීම සම්බන්ධ විස්තර 2024 දෙසැම්බර් 31 දින සිට https://external.sjp.ac.lk/convocation වෙබ්අඩවිය මගින් දන්වනු ලැබේ.

ඒ අනුව **ඔබට නියමිත දින නියමිත වේලාවට පමණක් පැමිණිය යුතු අතර එදින ඔබගේ ජාතික හැඳුනුම්පත සහ ශිෂ්‍ය වාර්තා පොත රැගෙන එන මෙන් කාරුණිකව දන්වා සිටිමි.**

- **පසුවිපරම් පෝරමය (Feedback Form )**

**තවද** 2025 ජනවාරි 03 **දිනට පෙර** https://external.sjp.ac.lk/convocation වෙබ් අඩවියෙහි පල කර ඇති පසුවිපරම් පෝරමය (Feedback) සම්පූර්ණ කල යුතුය.

## ➢ උපාධිලාභීන් උපාධි ප්‍රදානෝත්සවයට සහභාගීවීමේදී පිළිපැදිය යුතු උපදෙස් සහ ආචාරධර්ම

- උපාධි ප්‍රදානෝත්සවය දිනයේදී තමන්ට නියමිත සැසියට විනාඩි තිහකට පෙර පැමිණීම සහ පහත සඳහන් දෑ රැගෙන ඒම අනිවාර්ය වේ.
    - a) උපාධි ලෝගුව, සාටකය හා හිස්වැස්ම
    - b) ඔබ වෙත ලබා දෙන පෙරහැර අංකය සඳහන් ස්ටිකරය
    - c) ඡායාරූප ලබා ගැනීම වෙනුවෙන් ඔබ විසින් ගෙවන ලද අත්තිකාරම් මුදල සඳහා අදාල ආයතනයෙන් නිකුත් කළ රිසිට්පත
    - d) උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වීම සඳහා ඔබට ලබා දී ඇති අවසර පත්‍රය සහ දෙමව්පියන්/අමුත්තන් සඳහා ලබා දී ඇති අවසර පත්‍ර
    - e) එදිනට උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැසුම නැවත භාර දීම සඳහා ශිෂ්‍ය වාර්තා පොත

## ➢ උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය භාවිත කිරීම සඳහා වන ආචාරධර්ම

### a. උපාධි ලෝගුව හා හිස්වැස්ම භාවිත කිරීම

1) උපාධි ලෝගුව හා හිස්වැස්ම පැළඳිය යුත්තේ උපාධිලාභියා හෝ උපාධිධාරියා පමණක්ම වන අතර, උපාධි ප්‍රදානෝත්සවයේ උපාධිලාභීන්ගේ පෙරහැර පිටත්වීමට නියමිත අවස්ථාව වනවිට සෑම උපාධිලාභියෙකුම තම උපාධි ලෝගුව සහ හිස්වැස්ම පැළඳ සිටිය යුතුය.

2) උපාධි ලෝගුව හා හිස්වැස්ම නිවැරදිව පැළඳිය යුතු අතර, එහිදී හිස්වැස්මට සවිකර ඇති ටසලය (Tussle) වම්පසට සහ ඉලාස්ටික් රඳවනය හිසේ පිටුපසට සිටින සේ පැළඳිය යුතුය.

3) උපාධි ලෝගුව පැළඳීමේ දී,
    - ▪ කාන්තා උපාධිලාභීන් අනිවාර්යයෙන්ම අභිමත වර්ණයක සාරියකින් හෝ ඔසරියකින් පමණක් සැරසී සිටිය යුතුය.

- පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

**සැ.යු. - <u>ඉහත සඳහන් ආකාරයේ ඇඳුමකින් සැරසී නොපැමිණෙන උපාධිලාභීන්ට උපාධි පෙරහැරේ ගමන් කිරීම සහ උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ වේදිකාවට ප්‍රවිශ්ට වීමට අවස්ථාව නොලැබෙනු ඇත.</u>**

4) උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය උපාධිය සංකේතවත් කිරීම සිදු කරන බැවින් එය ඉතා ගෞරවාන්විතව භාවිත කළ යුතුය.

5) උපාධි ලෝගුවට අගෞරව නොවන ලෙස සුදුසු පරිසරයක සහ සුදුසු ඉරියව්වක සිට ඡායාරූප ගැනීම සිදු කළ යුතුය.

6) **ඔබ වෙත නිකුත් කරනු ලබන උපාධි ලෝගුව හා හිස්වැස්ම අදාළ උපාධිලාභියා විසින් පමණක් පැළඳිය යුතු වන අතර**, අන්සතු කිරීම හා උපාධිධාරීන් නොවන (ඥාතීන්, හිතමිතුරන් සහ දරුවන් වැනි) අයට පැළඳවීම නොකළ යුතුය.

***සාටකය***

- සාටකය පළඳවනු ලබන්නේ උපාධිය පිරිනැමුණු බව සංකේතවත් කිරීම සඳහා වන බැවින්, එය උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ **<u>වේදිකාවට ප්‍රවිශ්ට විමේදී පැළඳ සිටිය යුතුය.</u>**

- උපාධි ප්‍රදානෝත්සවයේ ආරම්භයේ සිට අවසානය දක්වා ඔබ විසින් පිළිපැදිය යුතු අනිවාර්ය මාර්ගෝපදේශ සහිත වීඩියෝ පටය (Convocation supporting video) https://external.sjp.ac.lk/convocation යන වෙබ් අඩවියට පිවිස නැරඹිය හැක. උපාධි ප්‍රදානෝත්සවයට පැමිණෙනවිට එම වීඩියෝ පටය නරඹා පැමිණිය යුතුය.

- කුලපති පෙරහැර සහ ආචාර්ය මණ්ඩලයේ පෙරහැර ශාලාවට ඇතුළු වන විට සහ උපාධි ප්‍රදානෝත්සවය අවසානයේ එම පෙරහැර ශාලාවෙන් පිටව යන තෙක් සියලු දෙනාම තම අසුන්වලින් නැගී සිටිය යුතුය.

- උපාධි ප්‍රදානෝත්සවය ආරම්භයේදි විශ්වවිද්‍යාල ගීතය සහ අවසානයේදි ජාතික ගීය ගායනා කිරීමට සූදානම්ව පැමිණිය යුතු ය (විශ්වවිද්‍යාල ගීතය පහතින් දක්වා අත).

- උපාධි ප්‍රදානෝත්සවයේ ඔබට නියමිත සැසිය අවසානයේ දී උපාධි ලෝගුව, සාටකය හා හිස්වැස්ම බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුලදී එදිනම භාර දීමටත් රු.6000/- තැන්පතු මුදල නැවත ලබා ගැනීමටත් අවශ්‍ය පහසුකම් සලසා ඇත. (උපාධි ලෝගුව, සාටකය හා හිස්වැස්ම භාරදෙන අවස්ථාවේ දී ඔබගේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ).

- මෙම උපාධි ප්‍රදානෝත්සවයේ සජීවී විකාශනයක් http://external.sjp.ac.lk/ දරන වෙබ් අඩවිය ඔස්සේ විසුරුවා හැරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා අදාල වෙබ් සබඳතාවය (Link) ඒ ඒ සැසිය ආරම්භ වූ විගස ඉහත වෙබ් පිටුවෙහි දිස් වේ.

➢ **උපාධිලාභියා හැර වෙනත් අයෙකු විසින් උපාධි ලෝගුව/ සාටකය/ හිස්වැස්ම ප්‍රවේශ පත්‍ර ලබා ගන්නේ නම් ඊට අදාල විස්තර පත්‍රිකාව** http://external.sjp.ac.lk/ **පල කරනු ලැබේ. එම පත්‍රිකාව පුරවා උපාධිලාභියාගේ කැමැත්ත ප්‍රකාශ කල ලිපියක් සමඟ උපාධිලාභියාගේ ජාතික හැදුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත රැගෙන ආ යුතුය.**

18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා ඉහත දක්වා ඇති උපදෙස්වලට අනුව කටයුතු කිරීමෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.



නියෝජ්‍ය ලේඛකාධිකාරී

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

2024-12-24

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ගීතය**

ශ්‍රී ලංකා පින්බර රන් දෙරණේ
ශ්‍රී නිවාස වූ මහ අගනගරේ
ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ
ශ්‍රී නාමය රඳවවු ලෝ මුදුනේ

හික්කඩුවේ ශ්‍රී සුමඟුල් සමිඳුන්
වැලිවිටියේ සෝරත බඳු යතිඳුන්
බිහිකළ විද්‍යෝදය විදු බිම දුන්
එළියෙන් දිවි මග සරසවු

අයුක්තියේ දී විවාදශීලී
අසත්‍යයේ දී විචාරශීලී
වියත් සභා මැද සමාජශීලී
වියතුන් වී දැය පොබයවු
විජ්ජා උප්පතතං සෙට්ඨා ..//

**ගේය පද රචනය** - සේවාර්පිත මහාචාර්ය සුනිල් ආරියරත්න
**තනු නිර්මාණය** - ආචාර්ය රෝහණ වීරසිංහ

# 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**උපාධිලාභියා හැර වෙනත් අයෙකු උපාධි ලෝගුව/ සාටකය/ හිස්වැස්ම/ ප්‍රවේශ පත්‍ර ලබා ගන්නේ නම් පහත කරුණු සම්පූර්ණ කළ යුතුය.**

**උපාධිලාභියාගේ තොරතුරු**

1. උපාධිලාභියාගේ නම : ..........................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................
3. පෙරහැර අංකය : ..........................................................................
4. දුරකථන අංකය : ..........................................................................

**උපාධිලාභියා වෙනුවට උපාධි ලෝගුව භාර ගැනීමට පැමිණෙන්නාගේ තොරතුරු**

5. භාර ගන්නා අයගේ නම : ..........................................................................
6. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................
7. දුරකථන අංකය : ..........................................................................

උපාධිලාභියාගේ කැමැත්ත සහිත ලිපිය අමුණා ඇත / නැත.

ඉහත නම් සඳහන් උපාධිලාභියාට හිමි 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වීම සඳහා ලබා දෙන උපාධි ලෝගුව/ සාටකය/ ප්‍රවේශ පත්‍ර ......................................................... යන මා විසින් ලබා ගන්නා අතර මෙහි සියල්ලේම සම්පූර්ණ වගකීම මා සතු වන බව මෙයින් ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ........................... | ......................... |
| අත්සන | දිනය |

---

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා :**

පරීක්ෂා කර උපාධි ලෝගුව/ සාටකය/ ප්‍රවේශ පත්‍ර ඉහත නම් සඳහන් භාරකරුට භාර දුනිමි.

| | |
|---|---|
| .......................... | .......................... |
| අත්සන | දිනය |